# ශ්‍රී ලංකාවේ පාසල්වල බුදුදහම ඉගැන්වීම.

(10 ශ්‍රේණිය - ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනය.)

අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කෙරෙන

නිබන්ධනයයි.

UCLIB
398164

විනීතා සමරපති සෝමසරණ.
M.Phil. 80/25.
ශාස්ත්‍රවේදී (ලංකා.)
අධ්‍යාපන ඩිප්ලෝමා (ලංකා.)

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්වවිද්‍යාලය,
කොළඹ 03.

1984.03.29.

## <u>සංක්ෂිප්තය.</u>

ළමයකුගේ ජීවිතය හැඩ ගැස්වීමෙලා ආගමික අධ්‍යාපනයක ඇති වැදගත්කම අද බොහෝ දෙනෙකු විසින් පිළිගෙන ඇත. ඒ පිළිබඳව නොසලකා හරින ලද ඇතැම් රටවල් වර්තමානයේ මුහුණ දී ඇති ගැටළුත්, විශේෂයෙන්ම, දශක හතරක පමණ කාලයක සිට ආගම ධර්මය (බුද්ධ-ධර්මය) විෂය මෙරට පාසල්වල උගන්වා ඇතත්, එබඳු ගැටළුමය ස්වභාවයක් මෙරටද ක්‍රමයෙන් පැන නැගී එන ආකාරයත්, දෙමාපියන් ඇතුළු ළමයා ඇසුරු කරන මුළු සමාජයම මේ සම්බන්ධව බලපානු ලබතත්, ළමයකු ආගමික ජීවිත-යකට හැඩ ගැස්වීමේ වගකීම පාසලට පැවරීමේ අවශ්‍යතාව හා වැදගත්කම පිළිබඳවත් පළමු පරිච්ඡේදයේ සාකච්ඡා වී ඇත.

ඈත අතීතයේදී මෙරට අධ්‍යාපනය ගොඩ නැගුණේ බුදුධාගම පදනම් කොට ගෙනය. ආගමික අධ්‍යාපනයකින් ලබාදියයුතු අරමුණුත්, අධ්‍යාපන අරමුණුත් අතර එකල ගැටුමක් නොවීය. මේ නිසා ආගමික අධ්‍යාපන අරමුණු සාධනයවීම සම්බන්ධව ගැටලුවක් නොවීය. එහෙත්, 16 වැනි සියවසේදී විදේශීය ආධිපත්‍යයට මෙරට නතුවීමත් සමගම විශේෂයෙන්ම බ්‍රිතාන්‍ය සමයේදී, අධ්‍යාපනය රජයේ තනතුරු සඳහා සුදුසුකම් ලබාදීමේ මාධ්‍යයක් කර ගැනීම නිසා, පාසල් විෂයමාලාවට ඇතුළත්වූ විෂයයන්ගෙන් සුවිශේෂ අරමුණු පිළිබඳව සැලකිල්ලක් දක්වනු නොලැබුණි. මෙය වඩාත් අහිතකර ලෙස බලපෑයේ ආගම ධර්මය විෂය සම්බන්ධයෙනි. විශේෂයෙන් ආගමික අධ්‍යාපනයෙන් ලබාගන්නා ධාර්මික දැනීම හෝ විනය ගරුකත්වය පිළිබඳ ආකල්ප හෝ රජයේ තනතුරු ලබාගැනීම සඳහා සුදුසුකමක් නොවීය. 1880 පරම විඥානාර්ථ බෞද්ධ සංගමය යටතේ ආරම්භ වූ බෞද්ධ පාසල්වලින් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකරගැනීමට අපහසු වූයේද අධ්‍යාපන පරමාර්ථ සම්බන්ධයෙන් පැවති මෙම ඇගයීමයි. මේ නිසා ආගම ධර්මය විෂයමාලාවේ අනිවාර්ය විෂයයක් වුවත්, ඒ පිළිබඳව පාසල්-

වල අවධානය යොමුවූයේ විභාගය සමත්වීමට අවශ්‍ය දැනුම ලබාදීමේ අදහස සඳහා මිස විෂය අරමුණු සාධනය කරගැනීමට නොවේ. අද දක්වාත් පවතින මෙම ස්වභාවය පිළිබඳව දෙවැනි පරිච්ඡේදයේදී පැහැදිලිකර ඇත.

ආගම ධර්මය පාසල්වල ඉගැන්වීම තුළින්ම, ආගමික අධ්‍යාපන අරමුණු ඉටුකර ගැනීමට බලාපොරොත්තුවන බැවින්, ඒ සඳහා (බුදුදහම ඉගැන්වීමට) පදනම්කරගනු ලබන මූලික පාසල් සාධක පිළිබඳව තෙවැනි පරිච්ඡේදයේ විස්තර වෙයි.

විෂය අරමුණු ඉටුකර ගැනීමේ ලා බලපාන මෙම සාධකයන්ගේ කිසියම් දුර්වලතාවක් පවතින්නේද? එසේනම් ඒ කොතරම් දුරටද? ඊට අමතරව වෙනත් කවර සාධකයන් මේ සම්බන්ධව බලපාන්නේද? යනු විමසා බැලීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දිස්ත්‍රික්ක 7 කින් තෝරාගත් පාසල් 21 ක 10 ශ්‍රේණියේ බුදු දහම හදාරන සිසුන් 400 ක් හා එම ශ්‍රේණියේ බුද්ධධර්මය උගන්වන ගුරුවරුන් 50 කගේ නියැදියක් සඳහා දෙන ලද ප්‍රශ්න පත්‍ර දෙකක් හා එම පාසල්වලදීම කරන ලද සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යොදාගන්නා ලදි. මෙම පර්යේෂණ ක්‍රමය හතරවැනි පිරිච්ඡේදයෙන්ද,

එමගින් ලබාගන්නා ලද දත්ත, විශ්ලේෂණය කිරීම පස්වැනි පරිච්ඡේදයෙන්ද,

ඒ අනුසාරයෙන් එළඹෙන ලද නිගමන හා බුදු දහම පාසල්වල ඉගැන්වීමෙන් බලාපොරොත්තු වන අරමුණු ඉටුකරගැනීමට අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගයන් පිළිබඳ යෝජනා අවසාන පරිච්ඡේදයෙන්ද සඳහන්කර ඇත.